ශීර්ෂය - 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
යුරෝපා සංගමයේ ප්‍රදාන යටතේ මූල්‍යනය කරනු ලබන ශ්‍රී ලංකාවේ අධිකරණ අංශයට සහාය වීමේ ව්‍යාපෘතිය (JURE) විසින් 2024 වර්ෂය තුල ප්‍රදානය කර තිබූ වත්කම් අයිතම 19 කට අදාල රු.25,394,239ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.	ප්‍රමාද දෝෂයකින් CIGAS වැඩසටහනට අදාල වර්ෂයට ඇතුලත් නොවුණද 2025 පෙබරවාරි 24 දින CIGAS BOS වාර්තාවට ඇතුලත් කර ඇත.	සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු සියල්ල මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කල යුතුවේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 17ක් සඳහා සලසාගත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.91,594,784 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී	කඩදාසි භාවිතය සහ වාහන භාවිතය අවම වීම, ඉන්ධන මිල අඩු වීම, තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි වීම. අලුත්වැඩියා කටයුතු අවම වීම සහ බලපත්‍ර ගාස්තු, විදුලිය, තැපැල්, ප්‍රවාහන හා රක්ෂණ ගාස්තු අවම වීම නිසා මෙම තත්ත්වය ඇති වූ බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කල යුතුවේ.

	තිබූ අතර මෙම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.		
(ආ)	මූලධන වැය විෂයයන් 04 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.22,737,537 ක ඉතිරිවීම් පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 සිට සියයට 89 දක්වා පරාසයක් ගෙන තිබුණි.	ගොඩනැඟිලි අලුත්වැඩියා ප්‍රමාද වීම, නව බඳවාගැනීම් ප්‍රමාද වීම, පුහුණු කටයුතු සීමා වීම සහ UNDP වැඩසටහන මඟින් වියදම් දැරීම නිසා මෙසේ වියදම් ඉතිරි වූ බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කර ඒ අනුව කටයුතු කල යුතුය.

3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අගෝස්තු 04 දින මියගිය නිලධාරියෙකුට අදාලව අය විය යුතු එකතුව රු.128,576 ක් වූ ණය ශේෂය සහ 2023 අගෝස්තු 02 දින සේවය හැර ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.172,500 ක් වූ ආපදා ණය ශේෂය 2025 අගෝස්තු 25 දින වන විටත් අය වී නොතිබුණි.	මිය ගිය නිලධාරිනියගේ මරණ පාරිතෝෂිතයට අදාල ප්‍රදාන පත්‍රය නිකුත් කල පසු ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 94 (2) හා (3) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ බැඳීම් හා බැරකම් ලෙස රු.10,215,397ක් දක්වා තිබුණද, භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් සහ බැරකම් පිළිබඳ වාර්තාවෙහි (SA 92) බැඳීම් හා බැරකම් ලෙස රු.5,986,785 ක් පමණක් දැක්වීම නිසා රු.4,228,612 ක වෙනසක් නිරීක්ෂණය විය.	SA 92 හි සඳහන් වන්නේ CIGAS වැඩසටහනෙහි 2024/12/31 දිනට ගිණුම්ගත වී ඇති බැඳීම් පමණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ 2025/01/01 සිට 2025/02/28 දක්වා 2025 වසර ප්‍රතිපාදන වලින් ගෙවන ලද පෙර වර්ෂයට අදාල එම කාලය තුලදී ලද බිල්පත් වලට අදාල ගෙවීම් වන අතර මේවා 2024 වසරේදී බැරකම් ලෙස ඇතුලත් කළ නොහැකි බව දක්වයි.	වර්ෂයට අදාළ සියලුම බැඳීම් හා බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතු අතර බැඳීම් හා බැරකම්වල නිවැරදි අගයන් SA 92 ආකෘතියේ ඇතුළත් කළ යුතු වේ.

(ආ)	මු.රෙ. 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිදු වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් වැය විෂයයන් දෙකක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිවීම් එකතුව රු.933,878 ක් වුවද එම වැය විෂයයන්ට අදාළව බැරකම් ලෙස එකතුව රු.1,459,078 ක් දක්වා තිබීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු.525,300 ක බැරකම්වලට එළඹ තිබුණි.	වැටලීම් රාජකාරි සඳහා භාවිතා කරන වාහනයක් ගරාජයේ අළුත්වැඩියා කරමින් තිබියදී මුල් ඇස්තමේන්තුවට අමතරව අතිරේක ඇස්තමේන්තුවක් ලබා දීම නිසා මෙම වැඩිවීම සිදුවිය. පවිත්‍රතා සේවය සඳහා 2024 දෙසැම්බර් මාසයේ බිල්පත, 2025 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවීම කර තිබීම නිසා මෙය පෙර වර්ෂයට අදාල බැරකමක් ලෙස සැලකිය නොහැකි බව දක්වයි.	මු.රෙ. 94 (1) විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ.

3.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු බව දක්වා තිබුණද 2024 වර්ෂය තුලදී අවස්ථා 12 කදී ලබාදුන් එකතුව රු.324,265 කට අදාලව පියවීමේ වවුචර් ඉදිරිපත්කර අතුරු අග්‍රිම පියවීම සඳහා දින 10 සිට දින 48 ක් අතර කාල පරාසයක් ගතවී තිබුණි.	අදාල කාර්යයන් ප්‍රමාද වීම, නිලධාරියා විදේශගත වීම, හදිසි විමර්ශන කාර්යයන්හි යෙදීම, අධිකරණ කාර්යයන්හි නිතිපතා යෙදීම සහ වෙනත් විවිධ හේතු නිසා අග්‍රිම පියවීම සඳහා කාල ප්‍රමාදයන් සිදු වී ඇති බව දක්වා ඇත.	මුදල් රෙගුලාසි 371(5) විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

3.5 අල්ලස් වැටලීම්වල - අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම සැසඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අල්ලස් වශයෙන් පරිහරණය සඳහා අත්තිකාරම් මුදල් ලබා දී එම වැටලීම් සාර්ථක වූ විට නීතිමය පියවර ගැනීම සඳහා එකී අත්තිකාරම් මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ රඳවාගෙන නඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සරප් වෙත එම මුදල් නිරවුල් කළ යුතු වුවද නඩු භාණ්ඩ	විගණිත දිනයේදී පැවති වැටලීම් අත්තිකාරම් ශේෂයෙන් රු.64,485 ක මුදලක් මේ වන විට නැවත නිදහස් කර ඇති අතර. අදාල විමර්ශන ගොනු ගෙන්වා ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල කඩිනමින් නිදහස් කිරීමට ඉදිරි පියවර ගන්නා බව දක්වා ඇත.	නඩු කටයුතු හා අභියාචනා අවසන් වූ පසුව අත්තිකාරම් සරප් වෙත නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ.

	අංශය විසින් 2025 අගෝස්තු 25 දිනට විගණනය වෙත ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව අවසන් වී ඇති නඩු 31කට අදාල වැටලීම් අත්තිකාරම් එකතුව රු.822,500 ක් විවිධ හේතු මත නිදහස් කිරීමට නොහැකිව පැවතුණි.		
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් මු.රෙ.756(6) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයට අදාළ නඩු භාණ්ඩ හා මුදල් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2025 ජූලි 11 දිනදී ය.	නඩු භාණ්ඩ සමීක්ෂණය සඳහා නීති නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇති අතර නඩු භාණ්ඩ අංශයේ නිලධාරීන්ද ඒකාබද්ධව මෙම කටයුත්ත සිදුකල යුතු බැවින් එම අංශයේ පවතින හදිසි හා අධික රාජකාරි බහුලත්වය හේතුවෙන් මෙය තරමක් ප්‍රමාද වී ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය ආරම්භයේ විමර්ශනය සඳහා පැවැති ගොනු සංඛ්‍යාව 2,353 ක් වූ අතර 2024 වර්ෂය තුල ලැබී තිබූ ගොනු සංඛ්‍යාව 2,941ක් සමඟ එකතුව 5,294ක ගොනු සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂය තුල විමර්ශන අංශය සතුව පැවතුණි. එයින් ගොනු 2,933ක් 2024 වර්ෂය තුල විමර්ශන කටයුතු සිදු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට විමර්ශන කාර්යයේ සක්‍රීයව පැවති ගොනු සංඛ්‍යාව 2,361 ක් වූ අතර එහි පැමිණිල්ල යොමු වූ වර්ෂය අනුව**,** වර්ෂයට අඩු ගොනු 715 ක්ද, වසර 01 සිට 05	සංඛ්‍යාලේඛන සමඟ එකඟ වන බව දක්වා ඇත.	පැමිණිලි ලද කාලය අනුව විමර්ශනයන් කඩිනමින් අවසන් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ.

	දක්වා කාලයට අදාල ගොනු 1283 ක්ද වසර 05 සිට 10 දක්වා කාලයට අදාල ගොනු 347 ක්ද සහ වසර 10 ට වැඩි ගොනු 16 ක්ද විය.		
(ආ)	නීති කාර්යයන් ඉටුකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට නීති අංශයේ එක් එක් නීති නිලධාරීන් භාරයේ පැවති ගොනු සංඛ්‍යාවේ එකතුව 846 ක් විය. නීති අංශයේ කාර්යයන් ඉටු කිරීමට අදාලව පවත්වාගෙන යායුතු, සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති ගොනු සංඛ්‍යාව, 2024 වර්ෂය තුළ නීති කාර්යයන් සිදු කිරීම සඳහා ලද ගොනු සංඛ්‍යාව, 2024 වර්ෂය තුල නීති කාර්යයන් සිදු කල ගොනු සංඛ්‍යාව සහ 2024 දෙසැම්බර් 31 දිනට නීති කාර්යයන් ඉටු කිරීමට පැවැති ගොනු සංඛ්‍යාවට අදාලව පැමිණිල්ල යොමු වූ වර්ෂය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	සංඛ්‍යාලේඛන සමඟ එකඟ වන බව දක්වා ඇත.	නීති අංශය තුල පවතින ලිපිගොනු පිළිබඳව යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුය.
(ඇ)	කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි පිළිබඳව වඩා කාර්යක්ෂම, නිවැරදි හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියා කිරීම සඳහා විධිමත් දත්ත කළමනාකරණ පද්ධතියක් සැකසීම අත්‍යවශ්‍ය කාරණයක් වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාව පිහිටුවා වසර 30ක කාලයක් ගතවී තිබුණද නිසිලෙස ක්‍රියාත්මක දත්ත කළමනාකරණ පද්ධතියක් නොමැති වීම හේතුවෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවේ සිට නඩු පවරන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලියේදී අදාල ලිපිගොනුව පවතින අංශය, ලිපිගොනුව භාරව සිටින පුද්ගලයා හා එහි තත්ත්වය පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබාගැනීමට නොහැකි වී තිබුණි.	UNDP ආයතනය විසින් පරිත්‍යාගයක් ලෙසින් මාර්ගගත ඉලෙක්ට්‍රොණික දත්ත පද්ධතිය ලබා දීමට එකඟ වූ අතර දැනට එම ආයතනය සමඟ 2025.06.30 දින ගිවිසුම් අත්සන් කර ඇති අතර අදාල දෘඩාංග(Hardware) සියල්ල සමාගම විසින් දැනටමත් ස්ථාපිත කර ඇති බව දක්වා ඇත.	විධිමත් දත්ත කළමනාකරණ පද්ධතියක් සැකසීම කඩිනම් කිරීමට පියවර ගත යුතුයි.
(ඈ)	2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මගින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සහ සත්‍යායනය කිරීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරී	මෙම පද්ධතියද UNDP ආධාර වැඩසටහන මගින් ලබා දීමට එකඟ වී ඇති අතර 2026 මාර්තු මාසය වන විට අවසන් කර මෙම කොමිෂන්	වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ මාර්ගගත ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතිය සැකසීමේ කාර්යයන් කඩිනම් කිරීමට කටයුතු කල යුතු වේ.

තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් පාලනය කරනු ලබන මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මඟින් මෙම කාර්යයන් සිදු කළ යුතුව ඇත. 2025 අගෝස්තු 25 දින තෙක් වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ මාර්ගගත ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතිය සැකසීමේ කාර්යයන් නිමවී නොතිබුණි.	සභාව වෙත ලබා දීමට කටයුතු කරන බව එම ආයතනය විසින් දන්වා ඇති බව දක්වයි.

4.2 විදේශ ආධාර ව්‍යාපෘති

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ධාරිතා සංවර්ධනය සහ අල්ලස හා දූෂණය පිලිබඳ දැනුවත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ කොමිෂන් සභාව අතර 2023 අප්‍රේල් මාසයේදී වසරක කාලයක් සඳහා ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව ක්‍රියාකාරකම් 19ක් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානයක් ලෙස රු.85,858,970ක ප්‍රතිපාදනයක් කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබුණි. ඒ අනුව එම මුදල් ප්‍රතිපාදන උපයෝජනය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිදු කරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාපෘතියේ මූලික ගිවිසුම අනුව 2023 අප්‍රේල් මාසයේදී ව්‍යාපෘතිය ආරම්භ කර 2024 මාර්තු මාසය අවසානය වන විට ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කළ යුතුව තිබුණද ව්‍යාපෘති ගිවිසුම අනුව අදාළ ක්‍රියාකාරකම් ඉටුකිරීමට කොමිෂන් සභාවට නොහැකි වීම නිසා 2024 ජූනි 30 දක්වා මාස 03කින් ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සිදුකර ව්‍යාපෘති ගිවිසුම සංශෝධනය කර තිබුණි.	කොමිෂන් සභාවේ පැවැති සේවක හිඟය හා UNDP විසින් වාරික මුදල් එකඟ වූ දිනයට එවීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘති කාලය දීර්ඝ වූ බව දක්වා ඇත.	ව්‍යාපෘති ගිවිසුම ප්‍රකාරව නියමිත කාලය තුළ අදාළ ක්‍රියාකාරකම් ඉටුකිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	ව්‍යාපෘති ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා ප්‍රදානයක් ලෙස ලබාදුන් එකතුව රු.85,858,970 ක මුදලින් රු.3,123,484 ක් උපයෝජනය නොකර නැවත විදේශ නියෝජිත ආයතනය (UNDP) වෙත ආපසු ගෙවා තිබුණි.	එක් වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම හා අනෙකුත් වැඩසටහන් සඳහා ඇස්තමේන්තු කළ මුදලට වඩා ප්‍රසම්පාදනයේදී සත්‍ය වියදම අඩුවීම නිසා සිදු වූ ඉතිරියක් බව දක්වා ඇත.	ව්‍යාපෘති ගිවිසුම අනුව උපරිම කාර්යක්ෂමතාවයකින් අරමුදල් යෙදවීමට කටයුතු කල යුතුවේ.

(ඇ)	ශ්‍රී ලංකාවේ අධිකරණ අංශයට සහාය වීමේ ව්‍යාපෘතිය (JURE) යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අතර වූ ගිවිසුම ප්‍රකාරව ගිවිසුම් කාලය තුල ලබා දීමට නියමිතව තිබූ වත්කම් අයිතම 31 කට අදාල වත්කම් 89 ක් කොමිෂන් සභාව වෙත ලබා ගැනීමටත් නිලධාරී පුහුණු වැඩසටහන් 02ක් පැවැත්වීමටත් කටයුතු කර නොතිබුණි.	මීට අදාළ කාර්යයන් ඉටු කිරීම UNDP (JURE) ව්‍යාපෘති කාර්යාලය විසින් සිදු කළ යුතු බවත් ව්‍යාපෘති කාලය තුළ එම කටයුතු ඉටු කර දීමට එම ආයතනය අපොහොසත් වී තිබුණු බවත් දක්වා තිබුණි.	ව්‍යාපෘති ගිවිසුම ප්‍රකාරව අදාළ කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුවේ.
(ඈ)	ශ්‍රී ලංකාවේ අධිකරණ අංශයට සහාය වීමේ ව්‍යාපෘතිය (JURE) වෙනුවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන අතර වූ ගිවිසුමෙහි ඇමුණුම 03 හි ක්‍රියාකාරකම් අංක 2.4 යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.775,000ක් වූ Children day program – Art Competition වැඩසටහන පවත්වා නොතිබුණි.	ලෝක ළමා දිනය පවත්වන්නේ සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මස 01 වෙනිදාය. ඒ අනුව ව්‍යාපෘතියේ අවසාන කාර්තුවට (2024 ජනවාරි - මාර්තු) වෙන්ව තිබූ මෙම වැඩසටහන කලින් පැවැත්වීමට හෝ වෙනත් වැඩසටහනක් පැවැත්වීමට UNDP ආයතනයේ ඉල්ලීමක් කලද ඒ සඳහා අවසර නොලැබුණු බව දක්වා තිබුණි.	ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත වීමේදී පැවරී ඇති ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනයක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.
(ඉ)	JURE ව්‍යාපෘතිය යටතේ දූෂණ නිවාරණ පුහුණු වැඩමුළු සඳහා සම්පත්දායකයින් යොදා ගැනීම සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST/7/ALLOW/05/0098 දරන 2023 ජුනි 16 දිනැති ලිපිය අනුව උපරිම වැඩමුළු 50ක් සඳහා අදාල කර ගත යුතු බව දක්වා තිබුණු නමුත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර නැවත අනුමැතියක් ලබා ගැනීමකින් තොරව වැඩමුළු 72ක් පවත්වා, පැවැත්වූ සියලුම වැඩසටහන් සඳහා ඉහත අනුමත කරනු ලැබූ සම්පත් දායක දීමනා	වැඩසටහන් 50 ක උපරිමයක් ලබා දී ඇත්තේ සම්පත් දායක නිලධාරියෙකු සඳහා වන බව දක්වයි.	ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීමේදී නියමිත කොන්දේසි අනුව කටයුතු කල යුතු වීම.

	අගයන්ම අදාල කරගෙන තිබුණි.		
(ඊ)	මෙම ව්‍යාපෘතිය යටතේ පවත්වා තිබූ මුළු වැඩමුළු ගණන 99ක් වූ අතර එයින් රු.7,946,617ක් වැය කර පවත්වන ලද වැඩමුළු 13 කට අදාලව, සහභාගිවූවන් පිලිබඳ තොරතුරු සමඟ අත්සන් ලේඛණ විගණනයට ඉදිරිපත් නොවීම නිසා ඒ පිළිබඳව තහවුරුවක් ලබාගත නොහැකි විය.	මෙම වැඩසටහන්වල අත්සන් ලේඛන කොමිෂන් සභාව සතු ගොනුවල ඇති බව දක්වා ඇත.	විෂයට අදාළ සියලු තොරතුරු අදාළ ලිපිගොනු තුළ ගොනු කිරීමට හා විගණන කටයුතු සඳහා අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.
(උ)	මෙම ව්‍යාපෘතියට අදාළව පවත්වා තිබූ වැඩමුළු සඳහා අදාල සහභාගිවන්නන් පිලිබඳ තොරතුරු පරික්ෂාවේදී ගිවිසුම අනුව වැඩසටහනට සහභාගී කර ගැනීමට අපේක්ෂා කල පුද්ගලයන් සංඛ්‍යාව, සත්‍ය ලෙස සහභාගීවූ සංඛ්‍යාව හා සැසඳීමේදී සියයට 18 සිට සියයට 63 දක්වා ප්‍රමාණයකින් සත්‍ය ලෙස සහභාගී වී තිබූ සංඛාවේ අඩුවීමේ අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.	එක් වැඩසටහනක් හැර අනිකුත් වැඩසටහන් රජයේ පුහුණු ආයතනවල පවත්වන ලද වැඩසටහන් බැවින් හා සති අන්ත දින හෝ නිවාඩු දිනවල වැඩසටහන් සංවිධානය කර තිබූ බැවින් පුහුණු ලාභීන්ගේ ආකර්ෂණය නොලැබීම මත සහභාගිත්වය අවම තිබූ බව දක්වා තිබුණි.	ගිවිසුමේ සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

4.3 ප්‍රසම්පාදනයන්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ඉදිරිපස පිහිටා ඇති පැරණි දෙමහල් ගොඩනැගිල්ල නාවික හමුදාව යොදා ගනිමින් නවීකරණය කිරීම සිදු කර තිබූ අතර කොමිෂන් සභාව ලබාදුන් තොරතුරු අනුව 2022 වර්ෂයේ සිට 2025 මාර්තු 26 දක්වා එකතුව රු. 29,399,847 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල නියදී විගණන පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉහත ගොඩනැගිල්ල නවීකරණයට අදාළව කාල රාමුවක් සහිත ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලස්මේ සඳහන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින් ලබාගත යුතුව තිබූ ගොඩනැගිල්ල	අලුත්වැඩියාව සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන්ද, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින්ද ඇස්තමේන්තු සකස් කර ගැනීමට ඉල්ලීම් සිදු කළ නමුත් එම ආයතන විසින් ඇස්තමේන්තු ඉදිරිපත් කර	ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු සකස් කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ.

	නවීකරණය කිරීමට අදාල මිල ඇස්තමේන්තුවක් හා නිර්මාණ සැලසුම් කොමිෂන් සභාව විසින් ලබා ගෙන නොතිබුණි.	නැති බව දක්වා තිබුණි.	
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ඡේදය ප්‍රකාරව විශේෂඥ දැනුම සහිත තාක්ෂණික සහය ලබා ගැනීමට තාක්ෂණික කමිටුවක් පත් කර නොතිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අවස්ථා 2කදී ලබා දී තිබූ නිර්දේශ හා ක්‍රමවේද අනුව අලුත්වැඩියාව සිදු කිරීමේදී ගොඩනැගිල්ලේ දිගුකාලීන කල්පැවැත්ම සහතික කිරීම සඳහා වෘත්තීමය මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ නිර්දේශ සහිත අලුත්වැඩියා කටයුතු සිදු කල යුතු බවට දක්වා තිබුණද, කොමිෂන් සභාව විසින් වෘත්තීමය තාක්ෂණික විශේෂඥවරයකුගේ සහය ලබා ගැනීමක් සිදු කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය නොවුණි.	මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍යා තාක්ෂණික සේවා නාවික හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශය හා විදුලි ඉංජිනේරු අංශය විසින් ලබා දී ඇති බැවින් තාක්ෂණික කමිටුවක් අවශ්‍යා නොවීය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි තාක්ෂණික කමිටු පත් කිරීමට හා වාර්තාවල නිර්දේශ පරිදි වෘත්තීමය තාක්ෂණික විශේෂඥ සහාය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ.
(ඇ)	උක්ත ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා 2020 දෙසැම්බර් 22 දිනැති අමප/20/1935/306/062 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පදනම්ව, මිල ගණන් කැඳවීමකින් තොරව තනි මූලාශ්‍ර ප්‍රසම්පාදන ක්‍රමයක් මත රාජ්‍ය ආයතන සඳහා සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙතින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට කොමිෂන් සභාව විසින් නියෝග ලබා දී ඇති බව 2022 ජනවාරි 04 දිනැති අධ්‍යක්ෂ (සැලසුම්) ගේ ලිපිය මඟින් දන්වා තිබුණද වරින්වර වෙනත් සැපයුම්කරුවන්ගෙන්	රටේ පැවති කොරෝනා තත්ත්වය හා අයහපත් ආර්ථික තත්ත්වය නිසා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ද්‍රව්‍ය ලබා ගැනීමට නොහැකි වූ බවත් අදාළ කාර්ය කඩිනමින් සිදු කළ යුතු වීමත් වෙළඳපළේ ද්‍රව්‍ය හිඟයක් පැවතීමත් මුළු ඇස්තමේන්තුව සකස් කිරීම සිදුකළ නොහැකි වූ බැවින් වරින් වර නාවික හමුදාව මගින් ඉදිරි කරන ලද ඉල්ලීම් මත මිලදී ගැනීම් සිදුකර ඇති බව දක්වා ඇත.	ප්‍රසම්පාදනයක් ආරම්භයේදීම මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර ද්‍රවය අවශ්‍යතාවය හඳුනාගෙන නිශ්චිත ක්‍රමවේදයක් යටතේ ප්‍රසම්පාදන කාර්යයන් සිදුකළ යුතු වේ.

	සෘජුව මිල ගණන් කැදවා අමුද්‍රව්‍ය මිලදීගැනීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි.		
(ඇ)	මෙම අලුත්වැඩියාව 2021 වර්ෂයේ දී ආරම්භ කර තිබූ අතර ගොඩනැගිල්ල අලුත්වැඩියාවට අදාලව ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2022 මාර්තු 15 දින වනවිට ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු අවසන් කර නිලධාරීන් ස්ථානගත කිරීම සිදු කළ යුතුව තිබුණද, අලුත්වැඩියා කටයුතු ආරම්භ කර වසර 03ක් ඉක්මවා ,2025 ජූනි 30 දින අලුත්වැඩියා කටයුතු අවසන්ව ඇති බව විගණනය වෙත දන්වා ඒවා තිබුණි.	මෙම ඉදිකිරීම් අදියර කිහිපයක් යටතේ සිදුකරන ලදී. ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු 2025 වර්ෂයේ ජූනි වන විට අවසන්ව ඇති බව දක්වා ඇත.	ක්‍රියාකාරී සැලැස්ම අනුව නියමිත කාලය තුළ අදාළ කාර්යයන් නිම කළ යුතු වේ.

5. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ වාහන නඩත්තු කිරීම පිළිබඳ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව සතු වාහන 26ක කිසිදු දිනෙක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.	2024 වර්ෂයේ සිට ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කල අතර මේ වන විට වාහන 10 ඉන්ධන පරීක්ෂාව සිදුකර ඇති අතර ඉතිරි වාහන වල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරන අතර ප්‍රවාහන කටයුතු බහුල වීම හා රියදුරු පුරප්පාඩු 17ක් පවතින බැවින් මෙම කටයුත්ත සිදුකිරීමට අපහසු වී ඇති බව දක්වා ඇත.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම.
(ආ)	මුදල් රෙගුලාසි 1645(අ) පරිදි ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් හා නියෝග ලබා දෙන ලදී.	මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ලොග් පොත් යාවත්කාලින කර පවත්වා ගත යුතු වීම.

(ඇ)	කොමිෂන් සභාවේ මූල්‍ය නොවන වත්කම්වලට අදාලව CIGAS පරිගණක පද්ධතිය තුලින් ජනිතවන වත්කම් කේතයන් භෞතික වත්කම්වල යොදා නොතිබීම හේතුවෙන් වත්කම් හඳුනාගැනීම හා අවශ්‍ය අවස්ථාවලදී වත්කම් නිසි ලෙස අපහරණය කිරීමට අපහසුතා මෙන්ම භාණ්ඩ සමීක්ෂණයේදී වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමටද නොහැකි විය.	දැනට පවතින සේවක හිඟය හා රාජකාරි බහුලත්වය හේතුවෙන් CIGAS පරිගණක පද්ධතිය තුලින් ජනිත වන කේතයන් භෞතිකව වත්කම්වල යෙදවීම කල නොහැකි වුවද 2025.06.01 දින සිට මිලදී ගන්නා භාණ්ඩ සහ දැනට තිබෙන භාණ්ඩ කේත කිරීම සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීමට උපදෙස් ලබා දුන් බව දක්වයි.	CIGAS පරිගණක පද්ධතියෙන් ජනිත වන වත්කම් කේතයන් භෞතික වත්කම්වල යෙදීමට කටයුතු කළ යුතු වීම.
(ඈ)	2017 ජුනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.29,852,332ක් වූ වත්කම් සහ අපහරණය කරන ලද පිරිවැය රු.396,115 ක් වූ වත්කම් පිලිබඳ වාර්තා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	2017 ජූනි 28 වැනි දානැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව තොරතුරු කාර්තු වශයෙන් යැවීමට දන්වා තිබුණද උපදෙස් ලබා දී තිබුනේ වාහන සම්බන්ධයෙන් වන තොරතුරු පමණක් යාවත්කාලීන කිරීමට පමණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වීම.
(ඉ)	නීති අංශයට හා නීති සහකාර අංශයට අදාළව 2025 මාර්තු 17 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පිළිවෙළින් අයිතම 77ක් හා අයිතම 21 ක් සඳහා ලෙජරය අනුව ශේෂ සඳහන් කර නොතිබීම හේතුවෙන් අසම්පූර්ණ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.	නීති අංශය / නීති සහකාර අංශය සඳහා වූ භාණ්ඩ වට්ටෝරු පොත් යාවත්කාලීන කිරීම සඳහා දැනට කටයුතු කරගෙන යමින් පවතින බව දක්වා ඇත.	භාණ්ඩ සමීක්ෂණ වාර්තා චක්‍රලේඛ ප්‍රකාරව සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වීම.

6. අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාව සතු කාර් රථයක් පින්තාරු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා එක් පෞද්ගලික ආයතනයක් වෙතින් පමණක් ඇස්තමේන්තු	මෙම මෝටර් රථයේ ධාවන පිරිවැය අධික වීම නිසා ධාවනයෙන් ඉවත් කර අපහරණය කිරීමට තීරණය කර ඇති බව දක්වා ඇත.	රජයේ මුදල් ඵලදායි කාර්යයන් තුල පමණක් අරපිරිමැසුම්දායි ලෙස යෙදවීමට කටයුතු කල යුතු වීම.

	ලබාගෙන තිබූ අතර ඒ සඳහා යාන්ත්‍රික ඉංජිනේරු හෝ තාක්ෂණික කමිටුවක නිර්දේශ ලබාගැනීමෙන් තොරව ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය මත පමණක් රු.2,983,438 ක් වැයකර තිබුණි. එසේ වුවද දෛනික ධාවන සටහන අනුව මෙම රථය 2023 දෙසැම්බර් 29 දින අවසන්වරට ධාවනය කර තිබුණු අතර අලුත්වැඩියාවෙන් පසුවද රථය ධාවන තත්ත්වයේ නොමැති බැවින් අපහරණය කිරීම සඳහා 2025 ජනවාරි 27 දින කමිටුවක් මඟින් අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව අලුත්වැඩියා වශයෙන් වැය කර තිබූ ඉහත මුදල අනාර්ථික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.		
(ආ)	උපාධිධාරී විමර්ශන නිලධාරීන් 200 දෙනෙකු බඳවාගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගය 2018 ඔක්තොම්බර් මාසයේදී පවත්වා, විමර්ශන නිලධාරීන් බඳවාගැනීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය අවසාන වන විට රු.7,392,734 ක් වැයකර තිබුණි. 2020 හා 2022 වර්ෂයන් තුල මෙම නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාදී අයවැය ප්‍රතිපාදන වෙන් කර දී තිබුණද විභාගය පවත්වා වසර 04 කට පසුව එනම් 2023 පෙබරවාරි 27 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි මෙම කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (සිවිල්) බඳවා ගැනීම නතර කර තිබුණි.	මෙම බඳවා ගැනීම් ක්‍රියාවලිය සඳහා රු.7,392,734 ක මුදලක් වියදම් වී ඇති අතර පසු කාලීනව අමාත්‍ය මණ්ඩල සමාලෝචන කමිටුව විසින් තනතුරු සඳහා බඳවා ගැනීම තාවකාලිකව නතර කිරීමට නිර්දේශ කිරීම නිසා බඳවා ගැනීමට නොහැකි වූ අතර, 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වර්තමානයේ එම තනතුරට බඳවා ගැනීමට නීතිමය හැකියාවක් නොමැති බව දක්වා ඇත.	රජයේ මුදල් ඵලදායි කාර්යන් තුල පමණක් අරපිරිමසුම්දායි ලෙස යෙදවීමට කටයුතු කල යුතු වීම.

7. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සේවක සංඛ්‍යාව 470 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 187 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 216 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 42 ක් වශයෙන් වූ අතර මෙම තත්ත්වය කොමිෂන් සභාවේ කාර්යයසාධනය කෙරෙහි ඍජුව බලපා හැකි බවද නිරීක්ෂණය විය.	2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 26 වගන්තිය පරිදි සහ 32 වගන්තිය යටතේ සාදන ලද රීතින්ට යටත්ව කොමිෂන් සභාව පත්කරගත් කාර්ය මණ්ඩලයක් වන අතර ඒ අනුව 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයේ නිර්දේශය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව දක්වයි.	කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු වීම හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කල යුතු වීම.